# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර (මාර්ගගත) - 2022

## නීති විද්‍යාව
(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

ප්‍රශ්න <u>තුනකට</u> **<u>(03)</u> පමණක්** පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01.යථාදෘෂ්ටිකවාදයේ ඓතිහාසික පරිණාමය විසින් නීතියේ සදාචාරාත්මක පරිමාණය විශාල වශයෙන් අභිබවායාමක් සිදු කරන ලද්දේ වුව ද, ස්වභාවික නීතියේ උරුමය නොකඩවා පවත්වාගෙන යාමට නූතන යුගයේ නීති පද්ධති අද්වීතිය ක්‍රම සහ විධි සොයා යයි.

ව්‍යවස්ථාපිත සහ අධිකරණමය විධික්‍රම ඔස්සේ ස්වභාවික නීති න්‍යායයේ ප්‍රධාන සංකල්ප අතරින් අවම වශයෙන් දෙකක් හෝ තෝරාගෙන, ඒවා ආරක්ෂා කරගැනීම සඳහා ගෙන ඇති ශ්‍රී ලාංකේය ප්‍රවේශයන් දෙසට අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

(100 ලකුණු)

02.ශ්‍රී ලංකාව මේ වනවිට සිටින්නේ එක්කෝ ඓතිහාසික දේශපාලන විප්ලවයක් නැත්නම් නීතියේ හා සාමයේ ව්‍යසනකාරී බිඳවැටීමක් අද්දරය. විප්ලවය යන සංසිද්ධිය මූලික නියාමයේ සඵලත්වය සහ වලංගුතාවය මෙන්ම පවතින ආණ්ඩුවේ සුජාතභාවය ප්‍රශ්න කරයි.

ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින නීති ක්‍රමයේ අකාර්යක්ෂම තත්ත්වය කෙල්සන්ගේ නිර්මලවාදය අනුසාරයෙන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. නිදසුන් ගෙනහැර දක්වමින් ඔබගේ විශ්ලේෂණය තහවුරු කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

(100 ලකුණු)

03.ඔස්ටින් හා බෙන්තම් විසින් නෛතික යථාදෘෂ්ටිකවාදය ඇද දමන ලද සංකල්පීය හා ගතානුගතික උපක්‍රමවලින් එය බේරා නිදහස් කරගැනීමට එච්. එල්. ඒ. හාට් උත්සහ දැරීය. බෙන්තම් සහ ඔස්ටින් විසින් ඉදිරිපත්කළ සංකල්පයට වඩා හාට්ගේ නීතිය පිලිබඳ සංකල්පය සමකාලීන නෛතික පද්ධතීන්ට වඩාත් අදාළ වේ.

මෙම තර්කය සමඟ ඔබ එකඟ වන්නෙහිද? බෙන්තම් සහ ඔස්ටින් විසින් ප්‍රවර්ධනය කරන ලද සම්භාව්‍ය යථාදෘෂ්ටිකවාදයේ සංක්ෂිප්තයට වඩා, 'බුද්ධිමය වශයෙන් පොහොසත් සහ සමාජමය වශයෙන් අදාළ' යැයි හාට්ගේ න්‍යාය තුළ ඔබ හඳුනාගනු ලබන අංග විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. සමකාලීන නීති පද්ධතිවලින් නිදසුන් ගෙනහැර දක්වමින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(100 ලකුණු)

04.වර්තමානය වන විට ශ්‍රී ලංකාව දේශපාලන, ආර්ථික, වෛද්‍ය සහ මානුෂීය අර්බුදයක් අතරමැද සිටියි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හසුරුවනු ලබන ආකාරය කෙරෙහි අප්‍රසාදය පළකිරීම උදෙසා, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය ද ඇතුළුව වෘත්තීය සමිති, ඒකාබද්ධ වැඩවර්ජනයක් සංවිධානය කළ අතර, වැඩවර්ජන කාලය තුළදී තමන්ගේ එදිනෙදා රාජකාරි කටයුතු ද වර්ජනය කරන ලදි. මෙම ඇතැම් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵලය වූයේ ශිෂ්‍යයන් ද ඇතුළු මහජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමයි.

ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ඉහත දැක්වෙන තත්ත්වය රෝස්කෝ පවුන්ඩ්ගේ සමාජ ඉංජිනේරුවාදය පිලිබඳ න්‍යායය අනුසාරයෙන් විශ්ලේෂණය කරන්න. ඔබගේ විශ්ලේෂණය දාර්ශනික දෘෂ්ටිකෝණයන්ගෙන් සනාථ කරන්න.

(100 ලකුණු)

05. *රෝ* එ. *වෙඩ්* 410 U.S.113 වනාහි පසුගිය ශතවර්ෂය තුල ලබාදුන් වඩාත්ම බලපෑම් සහගත නඩු තීරණ අතුරින් එකක් ලෙස සැලකේ. මෙම නඩු තීරණය හරහා ආණ්ඩුවේ සීමාකරණයන්ගෙන් තොරව කාන්තාවන්ට දරු ගැබක පළමු මාස තුන ඇතුලත ගබ්සාව සිදු කිරීම නෛතික වශයෙන් හැකි කරවන ලදි. කෙසේනමුත්, මෙම තීරණයට විවේචනයන් එල්ල නොවෙනවාම නොවේ. මෙම තීරණයට එල්ල වන ප්‍රධානම විවේචනයක් වන්නේ අධිකරණය විසින් ව්‍යවස්ථාදායකයේ භූමිකාව ආක්‍රමණය කරන්නට යෙදුනු බවයි. 2022 මැයි මාසයේ දී, *රෝ* එ. *වෙඩ්* තීන්දුව අධිතීරණය කල හැකිව තිබූ එක්තරා ශ්‍රේෂ්ඨාධිකරණ මතයක මුල් කෙටුම්පතක හෙළිදරවු වීමක් සිදු විය. එහි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදීමට නියමිතව තිබූ ඉඟිය අවියක් කරගනිමින්, ඇමරිකාවේ ප්‍රාන්ත 20කට ආසන්න ප්‍රමාණයක් උක්ත තීරණය සපථ කල වහාම ගබ්සාව නීති විරෝධී කිරීමට සූදානමින් සිටියි.

ඔබ, එක්කෝ තෝරාගැනීමේ අයිතිය වෙනුවෙන් පෙනී සිටින (Pro-choice) මානව හිමිකම් ක්‍රියාකාරකයෙක් (*රෝ* එ. *වෙඩ් තීරණය* අනුමත කරන අයෙක්) නැත්නම් ජීවිත සඳහා වන අයිතිය වෙනුවෙන් පෙනී සිටින (Pro-life) මානව හිමිකම් ක්‍රියාකාරකයෙක් (*රෝ* එ. *වෙඩ් තීරණයට* විරුද්ධ අයෙක්) වන්නේයැයි උපකල්පනය කරන්න. ඇමරිකානු තත්ත්වාකාරවාදයේ දෘෂ්ටිකෝණයෙන් අධිකරණයේ භූමිකාව, විනිශ්චයකාරවරුන්ගේ යුතුකම, සහ නීතියේ සංවර්ධනය උදෙසා ඔවුන්ගෙන් අපේක්ෂිත දායකත්වය පිලිබඳ තර්කානුකූල මතයක් ලියා දක්වන්න. උචිත නෛතික අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(100 ලකුණු)

06. සමාන සැළකීම් සහ සියලුම ආකාරයේ පීඩනයන් තුරන් කිරීම උදෙසා වූ දිගුකාලීන කාන්තා මෙහෙයුම්වලට ප්‍රශංසනීය ජයග්‍රහණ මෑතකාලීන ලෝකය විසින් අත්දකිනු ලැබ තිබේ. කෙසේනමුත්, ශ්‍රී ලාංකික නීති පද්ධතිය තුළ තවත් අත්පත් කරගැනීමට ඇති දෑ බොහෝය.

ඔබ එකඟ වන්නෙහිද? ශ්‍රී ලංකාවෙන් හා අවම වශයෙන් වෙනත් එක් අධිකරණ බල ප්‍රදේශයකින් නිදසුන් ගෙනහැර දක්වමින් සහ අදාළ අධිකාරීන් උපුටා දක්වමින් ඔබගේ මතය සාධාරණීකරණය කරන්න.

(100 ලකුණු)

*****